# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

## 2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

## සමාජීය විද්‍යා පීඨය

# ජනසන්නිවේදනය

## මාධ්‍ය ඉතිහාසය - MACO - E 1025

**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**

ප්‍රශ්න සංඛ්‍යාව - 08 යි. පිටු සංඛ්‍යාව - 02 යි. කාලය පැය : 03 යි.

---

01. " මානවයාගේ ආරම්භය තරම් ඈතට සන්නිවේදනය හා එම මාධ්‍යයන්ගේ ඉතිහාසය ගමන් කරයි." ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට 1450 දක්වා කාල පරිච්ඡේදය තුළ භාවිත කළ මානවයාගේ මූලික සන්නිවේදන චර්යාවන් සහ සොයාගැනීම් ඇසුරෙන් ඉහත කියමන පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. 1. යුරෝපයේ පුවත්පත්වල ආරම්භය තුළ දැකිය හැකි විශේෂතා හඳුන්වා දෙන්න. (ලකුණු 06)

    2. "ලාංකේය පුවත්පත් ක්‍රමයෙන් වර්ධනය වන්නේ සමකාලීන සමාජ, සංස්කෘතික දේශපාලන වෙනස්වීම් සමඟය." විස්තර කරන්න. (ලකුණු 14)

03. 1. "සිනමාවේ මූලික ව්‍යාකරණය ආරම්භ වන්නේ නිහඬ සිනමා යුගයේ දී ය" හඳුන්වා දෙන්න. (ලකුණු 06)

    2. ලාංකේය සිනමාවේ 70, 80 සහ 90 යන එක් එක් යුග තුළ මතු වූ ප්‍රධාන ප්‍රවණතා විමසන්න. (ලකුණු 14)

04. 1. "හඬ සහ තරංග පිළිබඳ වන භෞතික විද්‍යාත්මක අත්හදා බැලීම් යුරෝපීය සමාජයේ සමකාලින සමාජීය හා දේශපාලන අවශ්‍යතා මත පුළුල් විය." ලෝක ගුවන් විදුලි මාධ්‍ය ඉතිහාසය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

    2. ශ්‍රී ලාංකේය ගුවන්විදුලියේ වර්තමාන වැඩසටහන් සහ එහි අන්තර්ගතය මුල්කාලීන වැඩසටහන්වලින් වෙනස් වේ." විස්තර කරන්න. (ලකුණු 14)

05. 1. ශ්‍රී ලාංකේය රූපවාහිනියේ ආරම්භය හා වර්ධනය තුළ දැකිය හැකි විශේෂතා පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 10)

2. වර්තමාන දේශීය රූපවාහිනී වැඩසටහන් සහ එහි අන්තර්ගතය පිළිබඳ විචාරයක් කරන්න. (ලකුණු 10)

06. මාතෘකා **හතරක් (04)** පිළිබඳව සටහන් ලියන්න.

1. ලංකාලෝකය පුවත්පත (ලකුණු 05)
2. ප්‍රවෘත්ති සහ එහි සමාජ බලපෑම (ලකුණු 05)
3. පී.ඩී පැලිස් අප්පුහාමි (ලකුණු 05)
4. ඩී.ආර් විජේවර්ධන සහ ඩී.බී ධනපාල (ලකුණු 05)
5. මාර්ක් සුකර්බර්ග් සහ මාර්ටින් කූපර් (ලකුණු 05)
6. ලෙස්ටර් ජේම්ස් පීරිස් (ලකුණු 05)

07. මාතෘකා **හතරක් (04)** පිළිබඳව සටහන් ලියන්න.

1. සමාජීය මාධ්‍යය සහ නව යොවුන් චර්යාවන් (ලකුණු 05)
2. අන්තර්ජාලය සහ ජංගම දුරකථනය (ලකුණු 05)
3. 18 වන සියවසේ ජාතික ව්‍යාපාරය සහ ලාංකේය පුවත්පතේ ආරම්භය (ලකුණු 05)
4. ගුග්ලියෙල්මෝ මාර්කොනි හා එඩ්වඩ් හාෆර් (ලකුණු 05)
5. සබන් නාටක (Soap Opera) සහ යථාරූපී රූපවාහිනිය ( Reality TV) (ලකුණු 05)
6. ලාංකේය ප්‍රජා ගුවන් විදුලිය (ලකුණු 05)

08. " සන්නිවේදන මාධ්‍යය සමඟ ඩිජිටල් තාක්ෂණය සම්බන්ධවීමෙන් පුද්ගල පෞද්ගලිකත්වයට අදාළ නව මානව චර්යාත්මක ලෝකයක් නිර්මාණය විය." විග්‍රහයක් කරන්න.

(ලකුණු 20)

**********************************